# ශ්‍රී ලංකාවේ විසංමුතිය මර්දනය

2014 ඔක්තෝබර්



2014 ඔක්තෝබර් 24 වන දින පාර්ලිමේන්තුව දෙසට පෙළපාලියේ ගමන් කළ විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ට පොලීසිය ජල ප්‍රහාර සහ කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කළේය. (ඡායාරූපය - විකල්ප )

INFORM
Human Rights Documentation Centre
www.ihrdc.wordpress.com
informcolombo@gmail.com

## ආවරණය කළ සිදුවීම්

**A.** රජයට විරුද්ධ යැයි පෙනෙන පුද්ගලයන්ට මරණ තර්ජන, හිරිහැර සහ බිය ගැන්වීම්

**B.** අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස උල්ලංඝණය කිරීම්

**C.** රැස්වීමේ නිදහස උල්ලංඝණය කිරීම්

**D.** එ.ජා පරීක්ෂණ සඳහා සාක්ෂි ලබා දීමට විරුද්ධව තර්ජන

**E.** රජය පිළිබඳ විවේචනාත්මක අදහස් දැරිය හැකි පුද්ගලයන්ගේ ඔබ මොබ යාමේ නිදහසට බාධා

**F.** ශිෂ්‍ය ක්‍රියාකාරකම් මර්දනය

**G.** විපක්ෂ දේශපාලන පක්ෂ මර්දනය

ඉන්ෆෝම් ආයතනය 1990 දී ආරම්භ කරන ලද්දේ විශේෂයෙන් ම වාර්ගික ගැටුම සහ යුද්ධය සන්දර්භයෙ හි ශ්‍රීලංකා වේ මානව හිමිකම් තත්ත්වය නිරීක්ෂණය කරමින් කරුණු ගොනු කිරීමටත් එම කරුණු ලිඛිත සහ වාචික මැදිහත් වීම් හරහා ප්‍රාදේශීයව, ජාතිකව සහ ජාතයන්තරව වාර්තා කිරීමටත් ය. එසේම සිය අයිතීන් නිරන්තරයෙන් සහ ක්‍රමවත් ලෙස කෙලෙසීමට ලක්වන අනෙක්ජන ප්‍රජාවන් සමග ද ඉන්ෆෝම් ආයතනය කටයුතු කරයි. වර්තමානයේ දී ඉන්ෆෝම් ආයතනය මැතිවරණ නිරීක්ෂණය,මාධ්‍ය නිදහස සහ මානව හිමිකම් ආරක්ෂකයින් සම්බන්ධයෙන් සිය අවධානය යොමු කර තිබේ. ශ්‍රී ලංකාවේ කොළඹ පිහිටා ඇති ඉන්ෆෝම් ආයතනය දේශීය ක්‍රියාධරයින්, කණ්ඩායම් සහ ජාලයන් සමඟ මෙන්ම කලාපීය සහ ජාතයන්තර මානව හිමිකම් ජාලයන් සමග සහයෝගයෙන් කටයුතු කරයි.

## සාරාංශය

කරන ලදැයි කියන මානව හිමිකම් සහ ජාත්‍යන්තර මානුෂීය නීතිය උල්ලංඝණය කිරීම් පිළිබද පරීක්ෂණයක් පැවැත්වීම සඳහා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය විසින් පත් කරන ලද පරීක්ෂණ කණ්ඩායම වෙත තොරතුරු ඉදිරිපත් කිරීම සදහා ලබා දී තිබුණු කාලය අවසන් වනවාත් සමගම එම පරීක්ෂණය සදහා සහය දීමට උත්සහ කිරීම හේතුවෙන් උතුරේ දෙමළ  පුද්ගලයෙක් අත්අඩංගුවට ගෙන තිබුණි. එමෙන්ම කිහිපදෙනෙක්ව පරීක්ෂාවට ලක් කරන ලද අතර ඒ පුද්ගලයන්ට සැගවී සිටීමට සිදු විය.  රජය විවේචනය කරන කරන උතුරු පළාත් සභාවේ නියෝජිතයෙකු විසින් එ.ජා පරීක්ෂණ සදහා තොරතුරු ලබා දීමට ලබා දී ඇති කාලය දීර්ඝ කරන මෙන් ඉල්ලා සිටීම පිළිබඳව ජනාධිපති බලතල යටතේ පත් කර සිටින උතුරු පළාත් ආණ්ඩුකාරවරයා විසින් පැහැදිළි කිරීමක් අවශ්‍ය බව කියා සිටියේය. දෙමළ ජාතික සන්ධානය විසින් එක්සත් ජාතීන්ගේ යුධ අපරාධ පරීක්ෂණ සදහා ප්‍රමාණවත් සාක්ෂි නොමැති තොරතුරු ඉදිරිපත් කිරීමට කුමන්ත්‍රනයක් ඇති බවට චෝදනා කරමින් ඒ පිළිබදව රජය විසින් පරීක්ෂණයක් ආරම්භ කර ඇති බව සහ පරීක්ෂණ කණ්ඩායම වෙත යවන ලද ඉ මේල් පණිවුඩ නිරීක්ෂණය කෙරෙනු ඇති බව මාධ්‍ය වාර්තා කළේය. සිංහල පුවත්පතක් විසින් ප්‍රකට මානව හිමිකම් ආරක්ෂකයින්ව ත්‍රස්තවාදීන්ට අනුකම්පාව දක්වන්නන් ලෙස ලේබල් කරමින් එක්සත් ජාතීන්ගේ පරීක්ෂණ වලට තොරතුරු යවන බවට සහ එල්.ටී.ටී.ඊ සංවිධානයට නැවත නැගී සිටීමට සහය දක්වන බවට චෝදනා කළේය. වවුනියාව පුරවැසි කමිටුවේ සභාපතිවරයා පහර දීමක් හේතුවෙන් රෝහල් ගත කිරීමට සිදු විය. මෙම පහර දීමට හේතුව වූයේ චෝදනා ගොනු නොකොට 2014 මාර්තු මාසයේ සිට රදවා ගෙන සිටින දෙමල කාන්තාවක් මුදා හැරීම සදහා බල කරමින් පැවති විරෝධතාවයකට සම්බන්ධ වීමයි.

කොම්පඤ්ඤ වීදියේ පිහිටි ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ආරක්ෂක පුහුණු ආයතනයේ තොරතුරු සොයා බැලීමේ චාරිකාවන නිරත වූ විපක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කණ්ඩායමක් සහ ජනමාධ්‍යවේදීන් දෙදෙනෙකුට මැර කණ්ඩායමක් විසින් ප්‍රහාරයක් එල්ල කරන ලදී. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය විසින් සංවිධානය කළ ජනමාධ්‍ය වැඩසටහනකට හිරිහැර සහ බාධා එල්ල විය.  එහි ජ්‍යෙෂ්ට නිලධාරීන්ට, ඔවුන්ගේ පවුල් වල සාමාජිකයන්ට, සම්පත් දායකයින්ට සහ තර්ජනාත්මක දුරකතන ඇමතුම් සහ එස්එම්එස් පණිවුඩ ලැබී තිබුණි.  ස්වයං නීර්ණ අයිතිය පිළිබද පෙනී සිටින මාසික දෙමළ පුවත්පතකට ආරක්ෂක හමුදා විසින් හිරිහැර සිදු කළ අතර පුවත් පත මුද්‍රණයට සදහා යාමට පෙර ඔවුන්ව දැනුවත් කරන ලෙස මුද්‍රණකරුවන්ට බල කරන ලදී.  ආරක්ෂ හමුදා කදවුරක් තුළ දී අදාල පුවත් පත් බෙදාහරින්නා ව ප්‍රශ්ණ කර,  පසුව පහර දෙන ලදී. යාපනයේ ජ්‍යෙෂ්ට දෙමළ ජනමාධ්‍යවේදියෙක් සහ මාධ්‍ය නිදහස පිළිබද ක්‍රියාකාරිකයෙකුද ප්‍රශ්න කිරීම් වලට ලක් විය. දුම්රිය සේවකයන් විසින් දියත් කිරීමට සූදානවම් වූ වැඩ වර්ජනය සදහා තහනම් නියෝගයක් නිකුත් කරන ලද අතර විරෝධතාවයේ නිරත වූ ධීවර ප්‍රජාව වෙත ප්‍රහාර එල්ල විය. අතුරුදහන් වූ පුද්ගලයන් වෙනුවෙන් වූ වාර්ෂිත සැමරුම සංවිධානය කිරීමේ නිරත වූ මානව හිමිකම් ආරක්ෂකයින් අපකිරීතියට පත් කිරීම සදහා පෝස්ටර් ප්‍රදර්ශණය කර තිබුණි. තවද, සැමරුමට පෙර දින රාත්‍රියේදී ඔවුන්ගේ එක් පුද්ගලයෙකුගේ නිවසට ගල් ප්‍රහාරයක් එල්ල විය. විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් විශාල පිරිසකට තුවාල සිදු කරමින් ඔවුන් සම්බන්ධ වූ විරෝධතා ව්‍යාපාර අවම වශයෙන් තුනකටවත් විවිධ ස්ථාන වලදී ප්‍රහාර එල්ල විය. ශිෂ්‍යයන්ව මැස්සන් ලෙස හදුන්වමින් උසස් අධ්‍යාපන අමාත්‍යවරයා නැවත වතාවක් ශිෂ්‍යයන්ව අපකීර්තියට පත් පත් කළේය. අමාත්‍යවරයාගේ විශ්ව විද්‍යාල චාරිකාවට සමගාමීව ශිෂ්‍යයන් 12 දෙනෙක් අත්අඩංගුවට පත් විය.

රජය විවේචනය කිරීමේ ප්‍රවණතාවයක් ඇති පුද්ගලයන්ගේ  ඔබ මොබ යාමේ නිදහසට බාධා ඇති විය. එල්.ටී.ටී.ඊ සංවිධානයට නැවත නැගී සිටීමට සහය දෙන බවට චෝදනා එල්ල කරමින් ඝාතනය කරන ලද දෙමළ පුද්ගලයෙකුගේ බිරිද සහ මවගේ වලංගු වීසා සහිත විදේශ ගමන් අවස්ථා දෙකකදී වළක්වා ලන ලද්දේ විදේශගත වීම අවහිර කරමින් කිසිදු අධිකරණ නියෝගයක්ද නොතිබුණු තත්වයක් යටතේය. ආරක්ෂක අමාත්‍යංශයේ අවසරය නොමැතිව උතුරු පළාතේ යුද්ධයෙන් විනාශ වූ බොහෝ ප්‍රදේශ වලට ගමන් කිරීම විදේශ ගමන් බලපත් හිමි පුද්ගලයන්ට තහනම් විය.

ලෝක ආහාර දිනය වෙනුවෙන් සංවිධානය කළ වැඩසටහනක් සඳහා ගිය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නිලධාරීන්ට ආපසු හැරී ඒමට සිදු විය.

මෙම සිදුවීම් බොහොමයකට පොලීසිය, ආරක්ෂක හමුදා සහ රජය ඍජුවම සම්බන්ධ වූ අතර සෙසු සිදුවීම් වලට ආරක්ෂක හමුදාවන් සමග සම්බන්ධතා ඇති බව පෙනෙන හඳුනා නොගත් පුද්ගලයන් සහ කණ්ඩායම් සම්බන්ධ විය. මෙම සිදුවීම් වලට සම්බන්ධ පුද්ගලයන් අත්තඩංගුවට ගැනීමට රජය හෝ පොලීසිය කිසිදු ඍජු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බව මාධ්‍ය වාර්තා අනුව පෙනී යයි.

## ශ්‍රී ලංකාවේ විසම්මුතිය මර්දනය - 2014 ඔක්තෝබර් : සිදුවීම් ලැයිස්තුව

| | සිදුවූ දිනය | සිදුවූ ස්ථානය (දිස්ත්‍රික්කය) | සිදුවීමේ විස්තරය | මූලාශ්‍රය |
|---|---|---|---|---|
| A. | රජයට විරුද්ධ යැයි පෙනෙන පුද්ගලයන්ට මරණ තර්ජන, හිරිහැර සහ බිය ගැන්වීම් | | | |
| 1. | ඔක්තෝබර් 12 | - | රිවිර සිංහල පුවත් පත විසින් මානව හිමිකම් ආරක්ෂකයින්ව ත්‍රස්තවාදීන් ලෙස ලේබල් කිරීම | http://www.rivira.lk/epaper/sunday/2014/10/12/index.html#15/z (In Sinhala) |
| 2. | ඔක්තෝබර් 8 | නෙදුන්කෙර්නි (වවුනියා දිස්ත්‍රික්කය) | වවුනියාව පුරවැසි කමිටුවේ සභාපතිට පහර දීම | http://freejeyakumary.wordpress.com/2014/10/09/president-of-the-vavuniya-citizens-committee-attacked-for-organising-jeyakumary-protest/ |
| B. | අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස උල්ලංඝණය කිරීම | | | |
| 3. | ඔක්තෝබර් 15 | කොළඹ දිස්ත්‍රික්කය | ජනමාධ්‍යවේදීන් ගණනාවකට මරණ තර්ජන | http://srilankabrief.org/2014/10/fmm-challenges-the-government-to-bring-culprits-to-book/#more-20709 |
| 4. | ඔක්තෝබර් 14 | කොළඹ දිස්ත්‍රික්කය | ජ්‍යෙෂ්ට ජනමාධ්‍යවේදියෙකුට සහ ඔහුගේ පවුලේ සාමාජිකයන්ට මරණ තර්ජන | http://srilankabrief.org/2014/10/death-threats-to-senior-journalist-and-his-family-from-so-called-patriotic-force/ |
| 5. | ඔක්තෝබර් 14 සහ 15 | කොළඹ දිස්ත්‍රික්කය | ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා සංවිධානයේ සේවකයන්ට සහ පවුලේ සාමාජිකයන්ට මරණ තර්ජන | http://www.tisrilanka.org/?p=12277 |
| 6. | ඔක්තෝබර් 3 වන සතිය | යාපනය දිස්ත්‍රික්කය | උතුරේ මාසික දෙමළ පුවත්පතක් හිරිහැරයට ලක් වීම | http://www.tamilnet.com/art.html?catid=13&artid=37449 |
| 7. | ඔක්තෝබර් 1 | යාපනය දිස්ත්‍රික්කය | යාපනයේ ජ්‍යෙෂ්ට ජනමාධ්‍යවේදියෙක් ප්‍රශ්ණ කිරීම් වලට ලක් වීම | http://www.tamilnet.com/art.html?catid=13&artid=37400 |
| C. | රැස්වීමේ නිදහස උල්ලංඝණය කිරීම | | | |
| 8. | ඔක්තෝබර් 25 සහ 27 | කුස්සල (ගම්පහ දිස්ත්‍රික්කය) | වෘත්තීය සමිති ක්‍රියාකාරකම් අධෛර්යමත් කිරීම සඳහා වෘත්තීය සමිති නායකයින්ට පහර දීම | http://lankafocusnews.com/?p=30536 |

| | | | | |
|---|---|---|---|---|
| 9. | ඔක්තෝබර් 9 | කොටුව (කොළඹ දිස්ත්‍රික්කය) | දුම්රිය සේවක වෘත්තීය සමිති වැඩ වර්ජනය සඳහා තහනම් නියෝගයක් පැනවීම | http://www.island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=111850 |
| 10. | ඔක්තෝබර් 21 | මාලිගාවත්ත (කොළඹ දිස්ත්‍රික්කය) | විරෝධතාවයේ යෙදුණු ධීවර ප්‍රජාව වෙත ගල් ප්‍රහාර එල්ල කිරීම | http://www.ceylontoday.lk/51-75961-news-detail-fishers-protesting-eu-ban-pelted-with-stones.html |
| 11. | ඔක්තෝබර් 25 | ගම්පහ දිස්ත්‍රික්කය | අතුරුදහන් වූ පුද්ගලයන් සැමරුම ට විරුද්ධව පෝස්ටර් ඇලවීම | http://srilankabrief.org/2014/10/posters-pasted-against-remembrance-of-the-disappeared-to-be-held-tomorrow/ |
| 12. | ඔක්තෝබර් 26 | මීගමුව (ගම්පහ දිස්ත්‍රික්කය) | මානව හිමිකම් ආරක්ෂකයෙකුගේ නිවසට ගල් ප්‍රහාර | http://srilankabrief.org/2014/10/disappearances-in-sri-lanka-our-message-to-govt-by-brito-fernando/ |
| **D.** | **එ.ජා පරීක්ෂණ සඳහා සාක්ෂි ලබා දීමට විරුද්ධව තර්ජන** | | | |
| 13. | ඔක්තෝබර් | මුලන්කාවිල් (කිලිනොච්චි දිස්ත්‍රික්කය) | ශ්‍රී ලංකාවේ මානව හිමිකම් පරීක්ෂණ පිළිබඳ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස් කාර්යාලය ට සහය දුන් බවට චෝදනා කරමින් ත්‍රස්ත විමර්ශන ඒකකය විසින් දෙමළ පුද්ගලයෙකුව අත්අඩංගුවට ගැනීම | http://www.colombomirror.com/?p=715 |
| 14. | ඔක්තෝබර් 31 | යාපනය ( යාපනය දිස්ත්‍රික්කය) | උතුරු පළාත් සභා සාමාජිකයෙකු විසින් ශ්‍රී ලංකාවේ මානව හිමිකම් පරීක්ෂණ පිළිබඳ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස් කාර්යාලය වෙත කරන ලද ඉල්ලීමක් පිළිබඳ උතුරු පළාත් ආණ්ඩුකාර වරයා විසින් පැහැදිළි කිරීමක් ඉල්ලා සිටීම | http://www.island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=113229 |
| 15. | ඔක්තෝබර් 25 | - | දෙමළ ජාතික සන්ධානය විසින් ශ්‍රී ලංකාවේ මානව හිමිකම් පරීක්ෂණ පිළිබඳ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස් කාර්යාලය ට තොරතුරු ලබා දීම පිළිබඳ පරීක්ෂණයක් ආරම්භ කිරීම | http://www.island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=113229 |
| 16. | ඔක්තෝබර් 30 | - | ආරක්ෂක අමාත්‍යංශය ශ්‍රී ලංකාවේ මානව හිමිකම් පරීක්ෂණ පිළිබඳ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස් කාර්යාලය වෙත යවන ලද ඉමේල් නිරීක්ෂණය කිරීමට උත්සහ කිරීම | http://www.tamilnet.com/art.html?catid=13&artid=37456 |

| | | | | |
|---|---|---|---|---|
| 17. | ඔක්තෝබර් 30 | වන්නි ( කිලිනොච්චි සහ මුලතිවු දිස්ත්‍රික්කය) | ශ්‍රී ලංකාවේ මානව හිමිකම් පරීක්ෂණ පිළිබඳ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස් කාර්යාලය ට තොරතුරු ලබා දීම පිළිබඳ සෙවිල්ලෙන් සිට ඒ පිළිබඳ දැනුම් දෙන මෙන් ආරක්ෂක අංශ විසින් අන්තර්ජාල සහ ඡායා පිටපත් සේවා සපයන්නන්ට දැනුම් දීම | http://www.tamilnet.com/art.html?catid=13&artid=37456 |
| **E. රජය විවේචනය කිරීමට ප්‍රවණතාවයක් ඇති පුද්ගලයන්ගේ ඔබ මොබ යාමේ නිදහසට බාධා එල්ල කිරීම** | | | | |
| 18. | ඔක්තෝබර් 11 | උතුරේ පළාත් කිහිපයක් | විදේශිකයින්ට අවසර නොමැතිව යුද්ධය පැවති ප්‍රදේශ වලට ගමන් කිරීමට තහනම් කිරීම | http://www.sundaytimes.lk/141012/news/travel-restrictions-as-president-visits-north-122354.html<br>http://www.defence.lk/new.asp?fname=Foreign_Passport_holders_traveling_to_the_North_20141030_02 |
| 19. | ඔක්තෝබර් 8 | කිලිනොච්චි දිස්ත්‍රික්කය | එක්සත් ජාතීන්ගේ ආහාර වැඩසටහනේ ඉහල නිලධාරීන් සහ සිය ගණනක් දෙනා ඕමන්තෛහිදී ආපසු හරවා යැවීම | http://www.sundaytimes.lk/141019/news/top-fao-official-hundreds-of-others-turned-away-at-omanthai-123252.html |
| 20. | ඔක්තෝබර් 5 | කටුනායක ( ගම්පහ දිස්ත්‍රික්කය) | ඝාතනය කෙරුණු සැකරුවෙකුගේ බිරිද විදේශ ගත වීම වැළැක්වීම | http://tamilguardian.com/article.asp?articleid=12460 |
| 21. | ඔක්තෝබර් 21 | කටුනායක ( ගම්පහ දිස්ත්‍රික්කය) | හිටපු රැදවුම්කාරියක් (දෙමල මවක්) රටින් පිට වීම ගුවන්තොටුපළේදී අවහිර කිරීම | http://www.dailymirror.lk/54629/theiveegan-s-mother-prevented-from-leaving-sl<br>http://www.island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=112577 |
| **F. ශිෂ්‍ය ක්‍රියාකාරකම් මර්දනය** | | | | |
| 22. | ඔක්තෝබර් 10 | පබහින්න හංදිය ( රත්නපුර දිස්ත්‍රික්කය) | සබරගමුව විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයන්ගේ උපවාසයට ප්‍රහාර, 20 දෙනෙකුට තුවාල සිදුවීම | http://www.sundaytimes.lk/141019/news/satyagraha-attackers-still-at-large-while-students-go-on-own-rampage-123091.html |

| | | | | |
|---|---|---|---|---|
| 23. | ඔක්තෝබර් 6 | රත්නපුර දිස්ත්‍රික්කය | ශිෂ්‍යයන් 12 දෙනෙකු අත්තඩංගුවට ගැනීම සහ උසස් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් ශිෂ්‍යයන්ව මැස්සන්ට සමාන කිරීම | http://www.sundaytimes.lk/141019/news/satyagraha-attackers-still-at-large-while-students-go-on-own-rampage-123091.html |
| 24. | ඔක්තෝබර් 1 | හෝමාගම (කොළඹ දිස්ත්‍රික්කය) | උපවාසයේ යෙදුණු ශිෂ්‍ය භික්ෂූන්ට පහර දීම | http://www.lankaviews.com/sn/index.php?option=com_content&view=article&id=21848:2014-10-02-21-31-42&catid=100:2014-06-19-06-05-56&Itemid=151 (Sinhala) http://www.lankaviews.com/sn/index.php?option=com_content&view=article&id=21806:2014-09-25-09-33-04&catid=69:2009-08-07-09-41-10&Itemid=130 (Sinhala) |
| 25. | ඔක්තෝබර් 21 | කොළඹ දිස්ත්‍රික්කය | පොලිස් ප්‍රහාරයකින් විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් 20 දෙනෙකු තුවාල ලැබීම | http://www.amnesty.org/en/library/asset/ASA37/013/2014/en/77d973b8-c8e9-4b48-8fdd-117dae225789/asa370132014en.pdf |
| **H.** | විපක්ෂ දේශපාලන පක්ෂ මර්දනය | | | |
| 26. | ඔක්තෝබර් 21 | කොළඹ දිස්ත්‍රික්කය | විපක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ ජනමාධ්‍යවේදීන් දෙදෙනෙකු ප්‍රහාරයට ලක් වීම | http://www.dailymirror.lk/54673/journalists-among-unp-fact-finders-injured#sthash.9ZHt4zva.GqMaW99v.dpuf |
| 27. | ඔක්තෝබර් 18 | ඊර්ලාලයි (යාපනය දිස්ත්‍රික්කය) | උතුරු පළාත් සභා මන්ත්‍රීවරයෙකුගෙන් ප්‍රශ්න කිරීම | http://www.colombomirror.com/?p=502 |

## A. රජයට විරුද්ධ යැයි පෙනෙන පුද්ගලයන්ට මරණ තර්ජන, හිරිහැර සහ බිය ගැන්වීම්

### 1. මානව හිමිකම් ආරක්ෂකයින්ව ත්‍රස්තවාදීන් ලෙස ලේබල් කිරීම

**“**තානාපති සභයෙන් රට පනින්න හැදූ ගෝපි බිරිඳ කටුනායකදී කොටු වූ හැටි- ස්විස් තානාපති පළමු ලේකම් ගුවන් තොටුපොළටත් එයි.**”** යන හිසින් යුතුව 2014 ඔක්තෝබර් 12 වන දින රිවිර පුවත් පතේ පළ වූ ලිපිය මගින් මානව හිමිකම් ආරක්ෂකයින්ව එල්.ටී.ටී.ඊ ආධාරකරුවන් ලෙස ලේබල් කරන ලදී. ප්‍රමුඛ පෙළේ මානව හිමිකම් ආරක්ෂකයෙකු වන රුකී ප්‍රනාන්දු එල්.ටී.ටී.ඊ යට අනුකම්පාව දක්වන්නෙකු බව සඳහන් වූ මේ ලිපිය මගින් ඔහු එල්.ටී.ටී.ඊ නායකයෙකු ලෙස සැලකෙන ගෝපිට නවාතැන් පහසුකම් ලබා දුන් බවට චෝදනා කළේය. රුකී ප්‍රනාන්දු ශ්‍රී ලංකාවේ මානව හිමිකම් පරීක්ෂණ පිළිබද මහ කොමසාරිස් කාර්යාලය ට ලබා දීම සඳහා තොරතුරු එක් රැස් කරමින් සිටි බවට මෙම ලිපිය මගින් අනුමාන කර තිබුණි. තවත් ප්‍රමුඛ පෙළේ මානව හිමිකම් ආරක්ෂකයෙකු වන ඉමැනුවෙල් සෙබමාලෛ පියතුමාද කොටි හිතවාදියෙක් ලෙස එම ලිපියේම දක්වා තිබුණි. සෙබමාලෛ පියතුමා විසින් යුධ අපරාධ පිළිබද සාක්ෂි ලබා දීමට මහාවීර පවුල් වල සාමාජිකයන්ට කොළඹට පැමිණීම සඳහා රුපියල් ලක්ෂ 2ක් වලට ලබා දී ඇති බවට මෙම ලිපිය මගින් චෝදනා කළේය. මෙසේ එල්.ටී.ටී.ඊ සහයකයන් ලෙස පුවත්පත විසින් නම් කළ තවත් මානව හිමිකම් ආරක්ෂකයෙකු වූයේ බාලේන්ද්‍රන් ජයකුමාරි මහත්මියයි. අතුරුදහන් වූ දෙමළ තරුණයෙකුගේ මවක් වන ජයකුමාරි මහත්මිය සත්‍යය සහ යුක්තිය වෙනුවෙන් හඩ නගනන්නියකි. චෝදනා ගොනු නොකොට 2014 මාර්තු 14 වන දින සිට ඇයව රැඳවුම් භාරයේ රඳවා ඇත.

http://www.rivira.lk/epaper/sunday/2014/10/12/index.html#15/z - සිංහලෙන් (අවසන් පිවිසුම 2014 නොවැම්බර් 22)

### 2. වවුනියාව පුරවැසි කමිටුවේ සභාපති ට පහරදීම



ජී. තෙවරාජා මහතා රෝහලේදී (ඡායාරූපය: #freejayakumary)

2014 ඔක්තෝබර් 8 වන දින සවස 5.30 ත් 6 ත් අතර කාලයේදී වවුනියාව පුරවැසි කමිටුවේ සභාපති ජී. තෙවරාජා මහතා වෙත ප්‍රහාරයක් එල්ල විය. හෙතෙම ඔක්තෝබර් 10 වන දින පැවැත්වීමට යොදාගෙන තිබුණු ජයකුමාරි නිදහස් කරනු

"#FreeJeyakumary" ව්‍යාපාරය පිළිබඳ සාකච්චා කිරීම සඳහා පැවති වවුනියාව පුරවැසි කමිටු රැස්වීමකින් අනතුරුව සිය කඩය වෙත ගොස් ඇත. (2014 මාර්තු මාසයේ සිට චෝදනා ගොනු නොකොට රඳවාගෙන සිටින බාලේන්ද්‍රන් ජයකුමාරි මහත්මිය නිදහස් කරන මෙන් බල කිරීම සඳහා මෙම ව්‍යාපාරය සූදානම් කර තිබුණි) එහිදී යතුරු පැදි දෙකකින් පැමිණි සිවිල් ඇඳුමින් සැරසුණු පුද්ගලයන් සිවු දෙනෙකු විසින් යකඩ පොලු වලින් තෙවරාජා මහතාට පහර දී ඇත. ප්‍රහාරයෙන් ඔහු පැළඳ සිටි හිස් වැසුම හානියට පත් වී ඇති අතර හිස් වැසුමක් පැළඳ සිටින නිසා හිසට සිදු වූ තුවාල සුළු මට්ටමේ ඒවා බව වාර්තා විය. පහර දීම අතරතුර *"තමුසේ ජයකුමාරි වෙනුවෙන් උද්ගෝෂණයක් සූදානම් කරනවා නේද? එය නැවැත්වුවේ නැත්නම් අපි උඹව මරනවා!"* යනුවෙන් කෑඩුණු දෙළෙ බසින් ඔහුට තර්ජනය කර ඇත. මෙම සිදුවීම සිදු වී ඇත්තේ නඳුන්කර්නි හමුදා කඳවුර සහ පොලිස් ස්ථානය අතර මැද ස්ථානයකදීය. ප්‍රහාරයෙන් පසු වහාම ඔහුව නෙඩුකර්නි රෝහල වෙත ඇතුළත් කර ඇති අතර වැඩි දුර ප්‍රතිකාර සඳහා වවුනියාව රෝහලට ඇතුළත් කර ඇත.
http://freejeyakumary.wordpress.com/2014/10/09/president-of-the-vavuniya-citizens-committee-attacked-for-organising-jeyakumary-protest/ (අවසන් පිවිසුම 2014 නොවැම්බර් 22)

## B. අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස උල්ලංඝණය කිරීම

### 3. ජනමාධ්‍යවේදීන් ගණනාවකට මරණ තර්ජන

ට්‍රාන්ස්පේරන්ස් ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා සංවිධානය විසින් සංවිධානය කළ ජනමාධ්‍ය පුහුණු වැඩමුළුවක සහතික පත් ප්‍රදානය කිරීම සඳහා 2014 ඔක්තෝබර් 15 වන දින කොළඹදී පැවති උත්සවයක් අතරතුර එයට සහභාගී වූ ජනමාධ්‍යවේදීන්ට, සංවිධායකයන්ට සහ ඔවුන්ගේ පවුල් වලට 'දේශමාමක බලකාය' නමින් හඳුන්වාගත් කණ්ඩායමක් විසින් මරණ තර්ජන එල්ල කරන ලදී. ජනමාධ්‍යවේදී ජනූර් කිව්ලන් සහ අමදෝරු අමරවීර යන මහත්වරු මෙලෙස තර්ජන වලට ලක් වූ අය අතර වේ. වැඩමුළුවේ සංවිධායක ශාන් විජේතුංග මහතාට සහ සම්පත්දායක රාවය උපෙද්ශක කර්තෘ වික්ටර් අයිවන් මහතාටද තර්ජනාත්මක එස්.එම්.එස් පණිවුඩ ලැබී තිබුණි. මෙම දේශමාමක බලකාය නම් වූ කණ්ඩායම බුද්ධි අංශ වල ආරක්ෂාව ලබන තවත් එක් රූකඩ කණ්ඩායමක් බව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ප්‍රකාශ කර සිටියේය. තර්ජනාත්මක දුරකතන පණිවිඩ එවූ දුරකතන බුද්ධි අංශ නිලධාරීන්ට අයත් ඒවා බව ප්‍රකාශ කරමින් අමදෝරු අමරවීර මහතා විසින් එම ප්‍රකාශය නැවත වරක් අවධාරණය කරන ලදී.
http://srilankabrief.org/2014/10/fmm-challenges-the-government-to-bring-culprits-to-book/#more-20709 (අවසන් පිවුසුම 2014 නොවැම්බර් 22)

### 4. ජ්‍යේෂ්ඨ මාධ්‍යවේදියෙකුට සහ ඔහුගේ පවුලේ සාමාජිකයන්ට මරණ තර්ජන

ජ්‍යේෂ්ඨ මාධ්‍යවේදයෙකු වන හිටපු පුවත් පත් කර්තෘවරයකු වන ජයසිරි ජයසේකර මහතා සහ ඔහුගේ පවුලේ සාමාජිකයන් මරා දමන බවට 'දේශමාමක බලකාය නමින් හඳුන්වා ගත් මැර කණ්ඩායමක් තර්ජනය කළේය. මේ තර්ජන එල්ල කළේ ට්‍රාන්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා සංවිධානය විසින් සංවිධානය කළ ගවේෂණාත්මක ජනමාධ්‍යවේදය පිළිබඳ පැවැත්වුණු ජනමාධ්‍යවේදී පුහුණු වැඩමුළුක් සඳහා ඔහු විසින් ලබා දුන් දායකත්වය හේතුවෙනි. පොලිස්පති තුමා වෙත ඔහු විසින් ඉදිරිපත් කළ පැමිණිල්ලේ සිදුවීමේ වෙලාව සහ තර්ජනාතමක ඇමතුම් ලැබුණු දුරකතන අංක සඳහන් කර ඇති අතර මේ වන තුරු ඒ පිළිබඳව පොලීසිය විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. ජයසේකර මහතා ඔවුන්ගේ තර්ජන වලට ඇහුම්කන් නොදීම හේතුවෙන් තර්ජන එල්ල කළ පුද්ගලයන් දිගින් දිගටම ඇමතුම් ලබා දෙමින් ඔහුගේ බිරිද සහ දරුවන් මරා දමන බවට තර්ජනය කර ඇත.

"මෙම තර්ජන මගේ වෘත්තියට සහ ජීවිතයට බරපතල තර්ජනයක් එල්ල කරන අතර මගේ ජීවිතය ආරක්ෂා කිරීමට පියවර ගන්නා ලෙස මම ඉල්ලා සිටිමි. එසේම මා මරා දැමීමට තර්ජනය කළ පුද්ගලයන් සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් ආරම්භ කරන ලෙස සහ නීතිමය පියවර ගන්නා මෙන් ඉල්ලා සිටිමි." යනුවෙන් ජයසේකර මහතා විසින් පොලිස්පති තුමා වෙත ලබා දුන් පැමිණිල්ලේ සඳහන් කර ඇත.

http://srilankabrief.org/2014/10/death-threats-to-senior-journalist-and-his-family-from-so-called-patriotic-force/

(අවසන් පිවිසුම 2014 නොවැම්බර් 22)

## 5. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා සංවිධානයේ සේවක මණ්ඩලයට සහ ඔවුන්ගේ පවුල් වලට තර්ජන

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා සංවිධානය විසින් පැවැත් වූ ජනමාධ්‍ය පුහුණු වැඩමුළු මාලාවේ සහතික පත් ප්‍රධානෝත්සවය හා සම්බන්ධ වූ එහි සේවක මණ්ඩලයේ සාමාජිකයන් වෙත 2014 ඔක්තෝබර් 14 වන දින දී තර්ජනාත්මක එස්.එම්.එස් කෙටි පණිවුඩ ලැබී තිබුණි. වැඩසටහනේ ආරාධිත අමුත්තන් ගෙන් 50% පමණ දෙනාටද මෙම එස්.එම්.එස් කෙටි පණිවුඩ ලැබී තිබුණි. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර් නැෂනල් ශ්‍රී ලංකා ජ්‍යෝෂ්ට සේවක මණ්ඩලයේ පවුල් වල සාමාජිකයන්ටද තර්ජනාත්මක එස්.එම්.එස් කෙටි පණිවුඩ සහ දුරකතන ඇමතුම් ලැබී තිබුණි. 2014 ඔක්තෝබර් 15 වන දින මෙම සහතික ප්‍රධානෝත්සවය පැවැත්වීමට නියමිතව තිබුණේ කොළඹ 5 පිහිටි හෝටලයක දීය. කෙසේ වෙතත් දිගින් දිගටම එල්ල වූ තර්ජන හේතුවෙන් සංවිධායකයන් විසින් වැඩසටහන වෙනත් ස්ථානයකට ගෙන යන ලදී. සහභාගීවන්නන් නව ස්ථානය කරා යොමු කරමින් හෝටලයේ රැඳී සිටි ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර් නැෂනල් ශ්‍රී ලංකා සංවිධානයේ සේවකයන් විසින් සාමාන ඇඳුම් ඇද ගත් 15 දෙනකු පමණ සිදුවීම නිරීක්ෂණය කරමින් එහි රැඳී සිටිනු දැක තිබුණි. ඔවුන් බුද්ධි අංශ නිලධාරීන් දැයි සැක පහළ වී තිබුණි. ඒ අතරින් එක් අයෙකු මොටර් බයිසිකලයක පැමිණ තර්ජනාත්මක පණිවුඩයක් සහිත පත්‍රිකාවක් හෝටලයේ ඉදිරි දොරටුව අසල දමා ගොස් ඇත. මේ පිරිස ඔක්තෝබර් 15 වන දින උදෑසන 7.30 ත් 10.30ත් අතර කාලය තුළ හෝටයේ රැඳී සිටි ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර් නැෂනල් ශ්‍රී ලංකාහි සේවක මණ්ඩලයේ සාමාජිකයන් ගේ ඡායාරූප ලබා ගත් බව සහ ඔවුන් පිළිබඳ වැඩි දුර තොරතුරු සෙවීමට උත්සහ කළ බව විශ්වාසවන්ත ආරංචි මාර්ග සඳහන් කළෝය. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර් නැෂනල් ශ්‍රී ලංකාහි සේවකයන් හෝටලයෙන් නික්ම ගිය පසු පැමිණි හඳුනා නොගත් පුද්ගලයන් තිදෙනෙකු විසින් ඔවුන් පිළිබඳ හෝටලේ සේවක මණ්ඩලයෙන් තොරතුරු ලබා ගැනීමට උත්සහ කළ බව ඒ ආංචිමාර්ග සඳහන් කළේය.

http://www.tisrilanka.org/?p=12277 (අවසන් පිවිසුම 2014 නොවැම්බර් 22)




"එල්.ටී.ටී.ඊ එකට ඉඩ දෙන්න එපා. අවසනාන නිවේදනය" (ඡායාරූපය : Sri Lanka Brief / BBC)

### 6. උතුරේ දෙමළ මාසික පුවත්පතකට හිරිහැර

*ඉතු නාම් තෙආසාම්* නැමති මාසික පුවත්පත බෙදා හැරීම හේතුවෙන් තමන් නිරන්තර හිරිහැරවලට ලක් වන බව පේදුරුතුඩුවේ කුන්ග්වාර්කටෛ හි පුවත් පත් නියෝජිතයන් ප්‍රකාශ කළහ. යාපනය දිස්ත්‍රික්කයේ ඉරුපාලෛ සහ අච්චෙසු ප්‍රදේශ වලින්ද ඒ හා සමාන පැමිණිළි ලැබුණු බව වාර්තා විය. එසේම, යාපනයේ පිහිටි පුවත් පත් මුද්‍රණාලය වෙත ගිය ශ්‍රී ලංකා යුධ හමුදා නිලධාරීන් පුවත් පත මුද්‍රණය කිරීමට පෙර තමන්ට දැනුම් දෙන ලෙස මුද්‍රණාල හිමිකරුවන් වෙත නියෝග කර ඇත. කිලිනොච්චි දිස්ත්‍රික්කයේ උරිතිරාපුරම් ප්‍රදේශයේදී පුවත් පත් බෙදාහරින්නෙකු ඔක්තෝබර් මාසයේ තෙවැනි සතියේදී ප්‍රහාරයකට ලක් වී ඇත. මෙම ප්‍රහාරය එල්ල කර ඇත්තේ උරුතිරපුරම් හමුදා කඳවුරේදී ඔහුව ප්‍රශ්ණ කිරීමට භාජනය කිරීමෙන් සුළු මොහොතකට පසුවය. ඔහු පසු පස හඹා ආ කුඩා කණ්ඩායමකින් යුතු පිරිස ඔහුට පහර දී පුවත් පත් අසල ජලාශයට විසි කර ඇත. ටැමිල් නෙට් වෙබ් අඩවියට අනුව අදාල පුවත් පත ශ්‍රී ලංකාවේ පුවත් පතක් ලෙස ලියා පදිංචි වී ඇති එකක් වන දෙමළ ජනතාවගේ ස්වයං නිර්ණ අයිතිය පිළිබඳ දැඩිව කතා කරන මෙම පුවත් පතෙහි සංස්කාරක වරයා වන්නේ ජනප්‍රිය තීරු රචක නිදහස් ලේඛකයෙකු වන ඒ. ජෝතිලිංගම් මහතාය.

http://www.tamilnet.com/art.html?catid=13&artid=37449 (අවසන් පිවිසුම 2014 නොවැම්බර් 22)

### 7. යාපනයේ ජෝෂ්ට මාධ්‍යවේදියෙකුගෙන් ප්‍රශ්න කිරීම

යාපනයේ කන්කසංතුරෛ හි පිහිටි විශේෂ අපරාධ විමර්ශන අංශය විසින් ජනමාධ්‍ය ක්‍රියාකාරිකයෙකු වන ජේෂ්ඨ මාධ්‍යවේදී දයාපරන් රක්නම් මහතාව ප්‍රශ්න කිරීමට භාජනය කර ඇත. ජනමාධ්‍යවේදීන් සහ මාධ්‍ය ක්‍රියාකාරීන් කොළඹ සහ තවත් ප්‍රදේශ කිහිපයක පැවැත්වුණු මාධ්‍ය වැඩමුළුවලට සහභාගී වීමෙන් අනතුරුව හිරිහැර කිරීම් ආරම්භ වී ඇත. යාපනය මාධ්‍ය කවය හා සම්බන්ධ පුද්ගලයන් කවුරුන් දැයි අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් විසින් ප්‍රශ්ණ කර ඇත. තවද, ජාත්‍යන්තර මාධ්‍ය මුරපල්ලන් සමග පවත්වන සම්බන්ධය සහ ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයේ දී දකුණේ ජනමාධ්‍යවේදීන් සමග පැවති ජනමාධ්‍ය පුහුණු වැඩසටහන් පිළිබඳව ඔහුගෙන් ප්‍රශ්න කර ඇත.

http://www.tamilnet.com/art.html?catid=13&artid=37400 (අවසන් පිවිසුම 2014 නොවැම්බර් 22)

## C. රැස්වීමේ නිදහස උල්ලංඝණය කිරීම්

### 8. වෘත්තීය සමිති කටයුතු අධෛර්යමත් කිරීම සඳහා වෘත්තීය සමිති නායකයින්ට පහර දීම

වෘත්තීය සමිති නායකයින් ක්‍රමානුකූලව මර්දනය කරන බව පැහැදිළි බව නිදහස් වෙළඳ කළාප සහ පොදු සේවා සේවක සංගමය විසින් පොලිස්පතිවරයා වෙත ලියන ලද ලිපියක සඳහන් විය. නිදහස් වෙළඳ කළාපයේ ඒ.ජී.ටී සිලෝන් පෞද්ගලික සමාගමේ අලුතින් පිහිටුවන ලද වෘත්තීය සමිතියේ ශාඛා ලේකම්වරුන් දෙදෙනෙකුට එල්ල කළ ප්‍රහාරයන් පිළිබඳ ලිපියේ සඳහන් විය. ඔක්තෝබර් 25 වන දින ඒ.ජී.ටී සිලෝන් පෞද්ගලික සමාගමේ නිදහස් වෙළඳ කළාප සහ පොදු සේවා සේවක සංගමයේ ශාඛා ලේකම් වන දිනේශ් රංගන ශ්‍රී මාල් මහතා සේවය කරා යන අතරතුර පහරදීමකට ලක් වී ඇත. එදිනම එම සමාගමේම සේවය කරන තවත් නිදහස් වෙළඳ කළාප සහ පොදු සේවා සේවක සංගමයේ ශාඛා ලේකම් වරයෙකු වන ටී.එම්. රංජිත් තෙන්නකෝන් මහතා වෘත්තීය සමිති කාර්යාලය වෙත යන අතර තුර මැර පිරිසක් විසින් නවත්වා යකඩ පොලු වලින් පහර දීමට උත්සහ කර ඇත. මෙම ප්‍රහාර වලට විරෝධතාවය ප්‍රකාශ කිරීම සඳහා ඔක්තෝබර් 27 වන දින කටුනායක අවරිවත්ත මං සංදියේදී පිකටිං ව්‍යාපාරයක් පැවැත්විණි.

http://lankafocusnews.com/?p=30536 - සිංහලෙන් (අවසන් පිවිසුම 2014 නොවැම්බර් 22)




නිදහස් වෙළඳ කළාප සේවකයන් වෘත්තීය සමිති ක්‍රියාකාරිකයන්ට පහර දීම පිළිබඳව සිය විරෝධය (ඡායාරූපය - LankaFocusNews)

## 9. දුම්රිය සේවක සංගමයේ වැඩවර්ජනයට තහනම් නියෝග

දුම්රිය සේවක වෘත්තීය සමිති සංගමය විසින් පැවත්වීමට සූදානම් වූ වැඩ වර්ජනය අත්හිටවිය යුතු බවට කොටුව දිස්ත්‍රික් අධිකරණය විසින් තහනම් නියෝගයක් ලබා දී ඇති බවට වාර්තා විය. සාමාන්‍ය දිනකදී ධාවනය වන දුම්රිය ගණන 380ක් වුවත් වැඩ වර්ජනය අතරතුර රජයට සහය දෙන වෘත්තීය සමිති සාමාජිකයන් යොදා ගෙන ධාවනය කළ හැකි වූයේ දුම්රිය 80ක් පමණි.

http://www.island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=111850 (අවසන් පිවිසුම 2014 නොවැම්බර් 22)

## 10. විරෝධතාවක නිරත වූ ධීවර ප්‍රජාව වෙත ගල් ප්‍රහාර

විරෝධතාවයක් සඳහා කොළඹ මාලිගාවත්තේ පිහිට ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යාංශය ඉදිරිපිට ට රැස් වූ 300ක් පමණ වූ ධීවර ප්‍රජාවට ගල් ප්‍රහාරයක් එල්ල විය. ගල් ප්‍රහාරය එල්ල කළේ ආමාත්‍යාංශයෙන් බවට චෝදනා එල්ල විය. ප්‍රහාරයෙන් තුවාල ලැබූ ධීවරයන් තිදෙනෙක් රෝහල් ගත කළහ. ශ්‍රී ලංකාවෙන් මාළු ආනයනය කිරීම නැවත්වීමට යුරෝපා සංගමය ගත් තීරණය සහ ශ්‍රී ලංකා මුහුදු තීරයේ වීන ධීවරයන් මාළු ඇල්ලීම පිළිබඳව විරෝධය දැක්වීම සඳහා මෙ පිරිස පැමිණ සිටියහ.

http://www.ceylontoday.lk/51-75961-news-detail-fishers-protesting-eu-ban-pelted-with-stones.html (අවසන් පිවිසුම 2014 නොවැම්බර් 22)

## 11. අතුරුදහන් වූ පුද්ගලයන් සිහිකිරීම ට විරුද්ධව පොස්ටර ඇලවීම

මීගමුවේදී පැවැත්වීමට නියමිත වූ අතුරුදහන් වූ පුද්ගලයන්ගේ සැමරුමෙහි සංවිධායකයින් සහ සම්පත් දායකයින් අතුරුදහන් වූ පුද්ගලයන් ඩොලර් වලට විකුණන බව චෝදනා කරමින් පෝස්ටර් ඔක්තෝබර් 25 වන දින රාත්‍රියේදී කොළඹ සහ මීගමුව ප්‍රදේශ වල අලවා තිබුණි. මේ පෝස්ටර් වල සැමරුමේ ප්‍රධාන දේශක රාවය උපදේශක කර්තෘ වික්ටර් අයිවන් මහතා, ප්‍රමුඛ පෙළේ මානව හිමිකම් ආරක්ෂකයෙකු වන ආචාර්ය නිමල්කා ප්‍රනාන්දු මහත්මිය, අතුරුදහන්

වූවන්ගේ පවුල්වල එකමුතුවේ සභාපති සහ මෙම සැමරුමේ සංවිධායක බ්‍රිටෝ ප්‍රනාන්දු මහතා යන අයගේ ඡායාරූපයද ඇතුළත් විය. මෙම වැඩසටහන සඳහා සහයෝගය දැක්වූ සෙසු ක්‍රියාකාරීන් කලාකරුවෙකු සහ තවත් ජනමාධ්‍යවේදීන් ද මේ ඡායාරූප අතර විය. මෙම සැමරුම සංවිධානය කිරීමට සහය දැක්වූ “Right to Life” නැමති මානව හිමිකම් සංවිධානයේ සේවක මණ්ඩයේ කිහිප දෙනෙකුගේ ඡායාරූපද මේ අතර විය. මෙම පෝසටර් වල ඡායාරූප ඇතුළත් වූ මානව හිමිකම් ආරක්ෂකයින්ගේ නිවෙස් අසල මෙම පෝස්ටර් අලවා තිබුණි.

http://srilankabrief.org/2014/10/posters-pasted-against-remembrance-of-the-disappeared-to-be-held-tomorrow/
(අවසන් පිවිසුම 2014 නොවැම්බර් 22)




මානව හිමිකම් ආරක්ෂකයින්ට චෝදනා කරමින් කොළඹ සහ මීගමුව ප්‍රදේශ වල පෝස්ටර් අලවා තිබුණි

## 12. මානව හිමිකම් ආරක්ෂකයෙකුගේ නිවසට ගල් ප්‍රහාර

*"අතුරුදහන් වූවන් වෙනුවෙන් පෙනී සිටි අවුරුදු විසි හතරක් පුරා මගේ නිවසට ගල් ප්‍රහාරයක් එල්ල වූයේ පළමු වතාවටයි. ඒ ඊයේ (ඔක්තෝබර් 26 වන දින) නිවසට ගල් දෙකක් දමා ගැසීමයි. අතුරුදහන් වීම් පිළිබඳ පවතින මහජන සාකච්ඡාව සහ අතුරුදහන් වූවන් වෙනුවෙන් පොදුවේ සටන් කිරීම වෙනුවෙන් උතුරේ සහ දකුණේ මව්වරුන් අතර ගොඩනැගෙන එකමුතුව නවතා දැමීමට දරන උත්සහයයන්ය. "* යනුවෙන් අතුරුදහන් වූවන්ගේ පවුල් වල එකමුතුවේ සභාපති බ්‍රිටෝ ප්‍රනාන්දු මහතා කියා සිටියේය. මෙම සිදුවීම සිදුවූයේ ඔක්තෝබර් 27 වන දිනට යෙදී තිබුණු අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳ වාර්ෂික සැමරුම ට පෙර දිනයේදීය. ප්‍රනාන්දු මහතාගේ නිවසට ගල් ප්‍රහාරය එල්ල කිරීමට පෙර, ප්‍රනාන්දු මහතා ඇතුළු මානව හිමිකම් ආරත්ෂකයින්ගේ ඡායාරූප සහිත ඔවුන් දේශද්‍රෝහීන් සහ යක්ෂයන් බව පෙන්වන මඩ පොස්ටර් ඔවුන්ගේ නිවෙස් ඉදිරි පිට අලවා තිබුණි.

http://srilankabrief.org/2014/10/disappearances-in-sri-lanka-our-message-to-govt-by-brito-fernando/ (අවසන් පිවිසුම 2014 නොවැම්බර් 22)

## D. එක්සත් ජාතීන්ගේ පරීක්ෂණ සඳහා සාක්ෂි ලබා දීමට එරෙහිව තර්ජන

### 13. ශ්‍රී ලංකාවේ මානව හිමිකම් පරීක්ෂණ පිළිබද මහ කොමසාරිස් කාර්යාලය ට සහය දුන්නැයි ත්‍රස්ත විමර්ශන ඒකකය විසින් දෙමල පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීම

ශ්‍රී ලංකාවේ මානව හිමිකම් පරීක්ෂණ පිළිබද සාක්ෂි රැස් කිරීම සඳහා ලබා දෙන අයදුම් පත්‍රය බෙදා හැරීම හේතුවෙන් කිලිනොච්චියේ 58 හැවිරිදි දෙමල පුද්ගලයෙක් අත්අඩංගුවට ගැනීමට ශ්‍රී ලංකා පොලීසියේ ත්‍රස්ත විමර්ශන ඒකකය විසින් පොලීසියට නියෝග කර ඇතැයි කලින් වාර්තා විය. ශ්‍රී ලංකාවේ මානව හිමිකම් පරීක්ෂණ පිළිබද සාක්ෂි රැස් කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස් කාර්යාලයෙන් ලබා දී ඇති අයදුම්පත් බෙදා හරිමින් සිටියෙදී කිලිනොච්චියේ මුලන්කවිල් ප්‍රදේශයේදී ත්‍රස්ත විමර්ශන ඒකකය විසින් මොහුව අත්අඩංගුවට ගත් බව පසුව පොලීසිය ප්‍රකාශ කර සිටියේය.

“දරුණු යුද්ධයෙන් කිලිනොච්ච් දිස්ත්‍රික්කයේ ඉරංචි සිවපුරම් හි පදිංචි සින්තම්බි ක්‍රිෂ්ණරාජන් නමැත්තාට දැඩි බලපෑම් ඇති වී ඇත. යුද්ධයේ අවසන් අදියරේදී ෂෙල් වෙඩි වැදීමෙන් ඔහුගේ බාල දියණිය මිය ගොස් ඇති අතර එම නිසාම ඔහු එක්සත් ජාතින්ගේ පරීක්ෂණය සඳහා සාක්ෂි ලබා දිය හැකි පුද්ගලයෙකි. ත්‍රස්ත විමර්ශන ඒකකය විසින් ඔහුව අත්අඩංගුවට ගෙන ඇත්තේ එ.ජා පරීක්ෂණය සඳහා සාක්ෂි ලබා දීමේ අයදුම්පත් රැගෙන යාම යන චෝදනාව මතයි. ඔහුගේ ආරක්ෂාව සහ ඔහුව නිදහස් කර ගැනීම සඳහා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය වහාම මැදිහත් විය යුතුයි” යනුවෙන් දෙමළ ජාතික සන්ධානයේ ප්‍රකාශක යාපනය පාර්ලිමේන්තු මන්ත්‍රී සුරේෂ් කේ. ප්‍රේමචන්ද්‍රන් මහතා ප්‍රකාශ කළේය.

http://www.colombomirror.com/?p=715 (අවසන් පිවිසුම 2014 නොවැම්බර් 22)

### 14. උතුරු පළාත් ආණ්ඩුකාර වරයා විසින් උතුරු පළාත් සභා සභාපති ගෙන් පැහැදිළි කිරීමක් ඉල්ලා සිටීම



ශ්‍රී ලංකාවේ යුදසමයේ සිදුවූ මානව හිමිකම් කෙළෙසීම් සම්බන්ධයෙන් තොරතුරු එක්රැස් කිරීම සඳහා ලබා දී ඇති කාලය දිගු කරන මෙන් උතුරු පළාත් සභා සාමාජික ආනන්දි සසිධරන් මහත්මිය විසින් ජිනීවාහි එක්සත් ජාතින්ගේ මානව හිමිකම් මහ කොමසාරිස් කාර්යාලයෙන් කළ ඉල්ලීමක් පිළිබඳව උතුරු පළාත් සභා සභාපති සී.වී.කේ. සිවඥානම් මහතා ගෙන් උතුරු පළාත් ආණ්ඩුකාර විශ්‍රාම ලත් මේජර් ජෙනරාල් ජී.ඒ. චන්ද්‍රසිරි මහතා විසින් පැහැදිළි කිරීමක් ඉල්ලා ඇත. (සශිධරන් මහත්මියගේ සැමියා වූ එලිලන් එල්.ටී.ටී.ඊ යේ ප්‍රධාන සාමාජිකෙයකි )

http://www.island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=113229 (අවසන් පිවිසුම 2014 නොවැම්බර් 22)

ආනන්දි සශිධරන් ( ඡායාරූපය - Aljazeera)

### 15. දෙමල ජාතික සන්ධානය එ.ජා පරීක්ෂණය වලට තොරතුරු ලබා දීම පිළිබදව විමර්ශනයක්

එක්සත් ජාතීන්ගේ යුධ අපරාධ පරීක්ෂණ සඳහා පදනම් විරහිත තොරතුරු ලබා දීමට දෙමළ ජාතික සන්ධානය විසින් සිදු කරන ලදැයි කියන කුමන්ත්‍රණයක් පිළිබද රජය විසින් විමර්ශණයක් ආරම්භ කර ඇති අතර දෙමළ ජාතික සන්ධානයේ වව්නියා ජේෂ්ඨ නිලධාරියෙකු වන අල්වා පුල්ලේ විජෝන්ද්‍රකුමාර් හෙවත් සනි මාස්ටර් ගෙන් ප්‍රශ්න කිරීමට යන බව ද

අයිලන්ඩ් පුවත්පත වාර්තා කළේය. සම්බන්ධ වූවායැයි කියන දේශපාලනඥයින් දෙදෙනෙකු පිළිබඳ තොරතුරු සහතික කරන ලෙස ත්‍රස්ත විමර්ශන ඒකකය ඔහුට පවසා ඇත. මෙම දේශපාලඥයින් දෙදෙනාගෙන් එක් අයෙකු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකි. *"එල්.ටී.ටී.ඊ යේ පුහුණුව ලැබූ සිවිල් වැසියෙකු වන සින්නතම්බි ක්‍රිෂ්ණරාසා සතුව තිබී එ.ජා යුධ අපරාධ පරීක්ෂණ වලට සාක්ෂි ලබා දීම සඳහා අදාල හිස් අයදුම් පත් විසි පහක් සොයා ගැනීමෙන් පසුව පොලීසිය විසින් විජේන්ද්‍රකුමාර්ගේ නිවස පරීක්ෂා කරන ලදී. ඔක්තෝබර් 25 වන දින වන්නි දිස්ත්‍රික්කයේ මුලන්කවිල් ප්‍රදේශයේදී ක්‍රිශ්නරාසා යන අය අත්අඩංගුවට ගෙන ඇත. තමන්ට වවුනියාවේදී ඔක්තෝබර් 22 සවස් වරුවේ විජේන්ද්‍රකුමාර් යන අයගෙන් සාක්ෂි ලබා දීම සඳහා අදාල හිස් අයදුම්පත් ලැබුණු බව ප්‍රශ්ණ කිරීම් වලදී ඔහු ප්‍රකාශ කර ඇත."* ජ්‍යෙෂ්ට නිලධාරියෙකු උපුටා දක්වමින් අයිලන්ඩ් පුවත් පත සඳහන් කළේය.
http://www.island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=113229 (අවසන් පිවිසුම 2014 නොවැම්බර් 22)

### 16. ආරක්ෂක අමාත්‍යාංශය විසින් එ.ජා පරීක්ෂණ වෙත යනව ලද ඉ මේල් නිරීක්ෂණය කිරීම

ශ්‍රී ලංකාවේ මානව හිමිකම් පරීක්ෂණ පිළිබඳ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස් කාර්යාලය වෙත යවන ඉ මේල් පණිවුඩ පරීක්ෂාකරන මෙන් ආරක්ෂක අමාත්‍යාංශයට සම්බන්ධ බුද්ධි අංශ නිලධාරීන් විසින් අන්තර්ජාල සේවා සපයන්නන් වෙත රහසින් දැනුම් දී ඇති බව සහ ඒවායේ පිටපත් ලබා ගැනීම සඳහා "simple network packet sniffing" තාක්ෂණය යොදා ගෙන ඇති බව ටැමිල් නෙට් වෙබ් අඩවියේ දැක්විණි.
http://www.tamilnet.com/art.html?catid=13&artid=37456 (අවසන් පිවිසුම 2014 නොවැම්බර් 22)

### 17. එ.ජා පරීක්ෂණ සඳහා තොරතුරු ලබා දෙන පුද්ගලයන් පිළිබඳ අවදානයෙන් සිටින ලෙස අන්තර්ජාල සහ ඡායා පිටපත් සේවා සපයන්නන් වෙත ආරක්ෂක හමුදාව දැනුම් දීම

ශ්‍රී ලංකාවේ මානව හිමිකම් පරීක්ෂණ පිළිබඳ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස් කාර්යාලය වෙත තොරතුරු ලබා දීම සඳහා දිවුරුම් පෙත්සම් ආකෘති පත්‍ර පිටපත් කරන පුද්ගලයන් පිළිබඳ අවධානයෙන් සිටින ලෙස ශ්‍රී ලංකා යුධ හමුදාවේ වන්නි දිස්ත්‍රික්කයේ බුද්ධි අංශ විසින් අන්තර්ජාල සහ ඡායා පිටපත් සේවා සපයන්නන් වෙත දැනුම් දී ඇති බව ටැමිල් නෙට් වෙබ් අඩවිය වාර්තා කළේය.
http://www.tamilnet.com/art.html?catid=13&artid=37456 (අවසන් පිවිසුම 2014 නොවැම්බර් 22)

## E. රජය පිළිබඳ විවේචනාත්මක අදහස් දැරිය හැකි පුද්ගලයන්ගේ ඔබ මොබ යාමේ නිදහසට බාධා

### 18. ආරක්ෂක අමාත්‍යාංශයේ අවසරය නොමැතිව විදේශිකයන්ට යුද්ධය පැවති ප්‍රදේශ වලට යාම තහනම් කිරීම

විදේශිකයන්ට ආරක්ෂක අමාත්‍යාංශයේ අවසරය නොමැතිව යුද්ධය පැවති ප්‍රදේශ වලට ගමන් කිරීමට ශ්‍රී ලංකා රජය විසින් තහනම් කර ඇත. *"විදේශිකයන්ට උතුරු පළාත් වලට ගමන් කිරීම සඳහා පූර්ව අවසරයක් අවශ්‍ය වේ. ඒ සඳහා ආරක්ෂක අමාත්‍යාංශය වෙත ලිපියක් යොමු කළ යුතු වේ."* යනුවෙන් රජයේ තොරතුරු දෙපාර්තමේන්තුව ප්‍රකාශයක් නිකුත් කළේය. උතුරු පළාතේ දිස්ත්‍රික්ක 5න් 3ක් සහ තවත් දිස්ත්‍රික්ක දෙකක කොටත් මෙසේ තහනම් කළ ප්‍රදේශ වලට ඇතුළත් විය. ඇතැම් විදේශ ගමන් බලපත් හිමියන් ජාතික ආරක්ෂාවයට තර්ජනයක් වන ආකාරෙයෙන් හැසිරී ඇති නිසා මෙම නව නීතිය ක්‍රියාත්මක කිරීමට සිදු වූ බව යුධ හමුදා මාධ්‍ය අධ්‍යක්ෂ වරයා ප්‍රකාශ කළේය. මෙම නියෝගය නිකුත් වූයේ ජනාධිපති මහින්ද රජපක්ෂ මහතා නෙදින සංචාරයක් සඳහා උතුර බලා ගමන් කළ කාලය අතරතුරය. මෙම තහනම

නිසා සිය ගණනක් විදේශිකයන් සිය හෝටල් වෙන් කිරීම්ද අවලංගු කරමින් සිය චාරිකා අත් හැර දැමූ අතර සෙසු පිරිසව ඕමන්තේ මුර පොලේදී ආපසු හරවා යනව ලදී. අවමංගල උත්සව, මංගල උත්සව, ආගමික උත්සව සහ රාජකාරී සඳහා උතුර බලා යමින් සිටි සියළුම දෙනා කිසිදු පූර්ව දැනුම් දීමකින් තොරව ඕමන්තේ මුර පොලේදී නවත්වා ඇත.

http://www.sundaytimes.lk/141012/news/travel-restrictions-as-president-visits-north-122354.html (අවසන් පිවිසුම 2014 නොවැම්බර් 22)

http://www.defence.lk/new.asp?fname=Foreign_Passport_holders_traveling_to_the_North_20141030_02 (අවසන් පිවිසුම 2014 නොවැම්බර් 22)

මාධ්‍ය කේන්ද්‍රය - රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය
ஊடக மையம் - பாதுகாப்பு மற்றும் நகர அபிவிருத்தி அமைச்சு
MEDIA CENTRE - MINISTRY OF DEFENCE & URBAN DEVELOPMENT

No : 152, Galle Road, Colombo - 03, Sri Lanka
Tel : +94112439757 Fax : +94112439737 E-mail : spokesman@defence.lk, media.mod.ud@gmail.com

**PRESS RELEASE**

Whilst welcoming and appreciating positive assistance rendered by Friendly Countries, International Organizations as well as Non Governmental Organizations in peace building and development, it is the duty of the Ministry of Defence and Urban Development to take appropriate measures to prevent negative interventions, particularly in the Northern Province.

Conscious of its duty towards maintaining national security and creating necessary conditions for national processes, the Ministry of Defence and Urban Development requests foreign nationals to obtain prior approval when they intend travelling to the north. It is also informed that the objectives and purposes of the projects or other reasons for which they intend to travel are also be clearly indicated.

Foreign nationals intending to travel to Northern Province can obtain approval by sending written requests to the following address/fax:

Secretary, Ministry of Defence and Urban Development
(Attention Military Liaison Officer)
15/5, Baladaksha Mawatha
Colombo 03.
Fax: +94112328109

**P R WANIGASOORIYA USP**
Brigadier
Director

15 October 2014

## 19. ලෝක ආහාර වැඩසටහනේ ඉහළ නිලධාරීන් සහ සිය ගණනක් දෙනා ඕමන්තේ හිදී ආපසු හරවා යැවීම

ආරක්ෂක අමාත්‍යාංශය විසින් පනවනු ලැබූ පූර්ව අවසර ලබා නොගැනීම පිළිබද නියෝගය හේතුවෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ඉහළ නිලධාරීන් කිහිපදෙනෙක් ඕමන්තේ මුර පොලේදී ආපසු හරයා යවා ඇත. ලෝක ආහාර වැඩසටහනේ

ශ්‍රී ලංකා නියෝජිත බෙත් ක්‍රැව්ෆර්ඩ් මහත්මිය ඔක්කෝබර් 8 වන දින ඕමන්තහිදී හරවා යවන අවස්ථාවේදී ඇය කිලිනොච්චිය බලා ගමන් කරමින් සිට ඇත. ලෝක ආහාර වැඩසටහනේ නියෝජිතයන් ආරාධනා ලැබ සිටි ලෝක ආහාර දිනය සැමරීම සඳහා වූ උත්සවයට තමාටද ආරාධනා ලැබී තිබුණු බව උතුරු පළාත් කෘෂිකර්ම අමාත්‍ය පී. ඉන්ගරනේසන් කියා සිටියේය. කෙසේ වෙතත් ක්‍රැව්ෆර්ඩ් මහත්මියට ඕමන්තේ මුර පොළ පසු කිරීසට අවසර ලබා දී නො තිබූ බව ඔහු කියා සිටියේය.

http://www.sundaytimes.lk/141019/news/top-fao-official-hundreds-of-others-turned-away-at-omanthai-123252.html (අවසන් පිවිසුම 2014 නොවැම්බර් 22)

## 20. මරා දමන ලද සැකකරුවෙකුගේ බිරිදගේ විදේශ ගමන වැළැක්වීම

එල්.ටී.ටී.ඊ සාමාජිකයෙකු යැයි සැකකෙරෙන සෙල්වනායගම් කජීපන් ගේ බිරිද ගේ විදේශ ගමන ගුවන්තොටුපොළ නිලධාරීන් විසින් වළක්වා ඇති බව මාධ්‍ය වාර්තා කළේය. කජීපන් ශාමිලා මහත්මිය සිය ඥාතියෙකුගේ මංගල උත්සවයක් සඳහා වලංගු වීසා සහිතව ස්විස්ටර්ලන්තය බලා පිටත්ව යාමට සූදානමින් සිට ඇත. මෙම සිදු වීම අවස්ථාවේදී ස්විස් තානාපති කාරියාලයේ නිලධාරීන් කටුනායක ගුවන් තොටුපොළ වෙත පැමිණ ඇයව නිදහස් කරන මෙන් ආගමන නිගධාරීන්ගෙන් ඉල්ලා ඇත. කෙසේ වෙතත් ඔවුන් පවසා ඇත්තේ ඇගේ සැමියා පිළිබඳ පරීක්ෂණ තවමත් අවසන් වී නොමැති නිසා ඇයට රටින් පිට වීමට අවසර ලබා දිය නොහැකි බවයි. 2041 මාර්තු මාසයේදී ත්‍රස්ත විමර්ශන ඒකකය විසින් ශාමිලා මහත්මියව අත්අඩංගුවට ගෙන ප්‍රශ්න කර ඇත. ඇයට කිසිදු චෝදනාවක් එල්ල වී නොතිබුණු අතර පසුව ඇයව නිදහස් කරන ලදී. විදේශගත වීම වළක්වන කිසිදු අධිකරණ නියෝගයක් ඇය වෙත ලැබී ඇති බවට වාර්තා නොවේ. එල්.ටී.ටී.ඊ සංවිධානය නැවත පණ ගැන්වීමට කටයුතු කරන බව කියමින් ශ්‍රී ලංකා යුධ හමුදාව දියත් කළ මෙහෙයුමේදී තවත් පුද්ගලයන් දෙදෙනෙකුද සමග ගෝපි ලෙස හැඳින්වෙන සෙලවනායගම් කජීපන් ඝාතනය කරන ලදී.

http://tamilguardian.com/article.asp?articleid=12460 (අවසන් පිවිසුම 2014 නොවැම්බර් 22)

## 21. ගුවන් තොටුපොළේදී හිටපු රැඳවුම්කාරියකගේ විදේශ ගමන වැළැක්වීම

57 වියැති දෙළෙ මවක් වන සුන්දරලංගම් රජිතමලා මහත්මිය ගේ විදේශ ගමන කටුනායක ගුවන් තොටුපොළේදී වළක්වා ඇත. 2014 අප්‍රේල් මාසයේදී හිටපු රැඳවුම්කාරියක් වන රජිතමාලා මහත්මියගේ පුත්‍රයා සුන්දරලිංගම් ගජදීබන් හෙවත් තෙතවීගන් ව ආරක්ෂක හමුදාවන් විසින් වන්නි කැළයේදී මරා දමා ඇත. ඔහුගේ මරණයෙන් පසු ත්‍රස්ත විමර්ශන ඒකකය විසින් රජිතමාලා මහත්මිය ව අත්අඩංගුවට ගෙන ප්‍රශ්ණ කිරීම් වලින් පසුව මුදා හැර ඇත. ඇගේ විදේශ ගමන් බලපත්‍රයේ වසර හයක කැනේඩියානු වීසා සටහන් වී තිබුණු බව වාර්තා විය. එල්.ටී.ටීය නැවත ගොඩනැගීම සඳහා ජගතීබන්ගේ සම්බන්ධය පිළිබඳ පරීක්ෂණ අවසන් නොමැති නිසා රජිතමාලා මහත්මියට රටින් පිටවීමට අවසර ලබා දිය නොමැති බව රජයේ නියෝජිතයෙක් ප්‍රකාශ කළේය. කෙසේ වුවත් ඇයගේ විදේශ ගමන් නවත්වන කිසිදු අධිකරණ නියෝගයක් නිකුත් කර නොමැත.

http://www.dailymirror.lk/54629/theiveegan-s-mother-prevented-from-leaving-sl (අවසන් පිවිසුම 2014 නොවැම්බර් 22)
http://www.island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=112577 (අවසන් පිවිසුම 2014 නොවැම්බර් 22)

# F. ශිෂ්‍ය ක්‍රියාකාරකම් මර්දනය

## 22. සබරගමුව විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ගේ උපවාසයට ප්‍රහාර, 20 දෙනෙකුට තුවාල

බදුල්ල කොළඹ මාර්ගයේ පඹහින්න මං සන්දියේදී සබරගමුව විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් සහභාගී වූ සත්‍යාග්‍රහයකට ඔක්තෝබර් 10 වන දින රාත්‍රියේදී පෙට්‍රල් බෝම්බ සහ පොලු රැගත් මුහුණු ආවරණ පැළඳි මැර පිරිසක් විසින් විසින් ප්‍රහාරයක් එල්ල කර ඇත. මෙම ප්‍රහාරයෙන් ශිෂ්‍යයන් 20 දෙනෙකුට වැඩි පිරිසක් තුවා ලැබූ අතර ඉන් 13 දෙනෙකු

පඹහින්න ග්‍රාමීය රෝහලට ඇතුළත් කර ඇත. ඉන් 6 දෙනෙකු පසුව බලංගොඩ මූලික රෝහල වෙත මාරු කර යැවිණි. රාජ්‍ය පාලිත විශ්ව විද්‍යාල තුළ ශිෂ්‍ය සංගම් අහෝස් කිරීමට විරුද්ධව මෙම සත්‍යග්‍රහ ව්‍යාපාරය පවත්වා ඇත. විවිධ සිදුවීම් ආශ්‍රයෙන් විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ගේ පන්ති තහනම් කිරීම සහ මානව හිමිකම් කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධයෙන් විරුද්ධත්වය දැක්වීමද මෙම සත්‍යග්‍රහයේ අරමුණු විය.
http://www.sundaytimes.lk/141019/news/satyagraha-attackers-still-at-large-while-students-go-on-own-rampage-123091.html (අවසන් පිවිසුම 2014 නොවැම්බර් 22)



ප්‍රහාරයෙන් අනතුරුව : රජරට සහ කැළණිය විශ්ව විද්‍යාගයේ ශිෂ්‍යයන් විසින් විරෝධතාවයක් පැවැත්වීම (ඡායාරූපය: Sunday Times)

## 23. ශිෂ්‍යයන් 12 දෙනෙකු අත්අඩංගුවට ගැනීම සහ උසස් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් ශිෂ්‍යයන්ව මැස්සන්ට සමාන කිරීම

ඔක්තෝබර් 6 වන දි සබරගමුව විශ්ව විද්‍යාලයේ දී කළ කතාවකදී සත්‍යග්‍රහය ආරම්භ කළ ශිෂ්‍යයන්ව මැස්සන්ට සමාන කළ උසස් අධ්‍යාපන අමාත්‍ය එස්.බී. දිසානායක මහතා තමා ඔවුන්ට බය නැති බව ප්‍රකාශ කළේය. මේ අතර විශ්ව විද්‍යාලයට පැමිණෙමින් සිට අමාත්‍යවරයාගේ වාහනය අවහිර කිරීම හේතුවෙන් ශිෂ්‍යයන් 12 දෙනෙකු අත්තඩංගුවට ගෙන ඇත.
http://www.sundaytimes.lk/141019/news/satyagraha-attackers-still-at-large-while-students-go-on-own-rampage-123091.html (අවසන් පිවිසුම 2014 නොවැම්බර් 22)

## 24. උපවාසයේ යෙදුණු භික්ෂු ශිෂ්‍යයන්ට පහර දීම

උපවාසයක යෙදෙමින් සිටි පාලි විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය භික්ෂූන්වෙත හඳුනා නොගත් කණ්ඩායමක් විසින් ප්‍රහාරයක් එල්ල කර ඇත. ඇතැම් ශිෂ්‍ය භික්ෂූන් වෙත ප්‍රහාරකයන් විසින් පාවිච්චි කළ එන්ජින් තෙල් විසි කර තිබුණි. මෙම උපවාසය සති දෙකකටත් වැඩි කාලයක් තිස්සේ පැවැත්වෙමින් තිබී ඇත. ප්‍රහාරයට විරුද්ධව හෝමාගම දී විරෝධතා ව්‍යාපාරයක් පැවැත්විණි. මෙම උපවාසය පැවැත්වුනේ විශ්ව විද්‍යාල පහසුකම් සහ ප්‍රමිතිය ඉහළ දමන ලෙස බල කිරීමටය.
http://www.lankaviews.com/sn/index.php?option=com_content&view=article&id=21848:2014-10-02-21-31-42&catid=100:2014-06-19-06-05-56&Itemid=151 (අවසන් පිවිසුම 2014 නොවැම්බර් 22)
http://www.lankaviews.com/sn/index.php?option=com_content&view=article&id=21806:2014-09-25-09-33-04&catid=69:2009-08-07-09-41-10&Itemid=130 (අවසන් පිවිසුම 2014 නොවැම්බර් 22)



පහර දුන් පිරිස ඇතැම් භික්ෂූන් වෙත පාවිච්ච කළ එන්ජින් තෙල් විසි කර තිබුණි. (ඡායාරූපය LankaViews)

### 25. පොලිස් ප්‍රහාරයකින් විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් 20 දෙනෙකුට තුවාල




ඔක්තෝබර් 21 වන දින පාර්ලිමේන්තුව දෙසට පාගමනින් එමින් සිටි විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ට පොලීසිය විසින් ජල ප්‍රහාර සහ කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කළේය. එහිදී ශිෂ්‍යයන් 20 දෙනෙකු පමණ තුවාල ලැබූ බව සහ ඉන් 12 දෙනෙකු රෝහල ගත කළ බව වාර්තා විය. බොහොමයක් තුවාල පොලීසිය විසින් ශිෂ්‍යයන්ට ඍජුවම එල්ල කළ කඳුළු ගෑස් ප්‍රහාර වලින් ඇතිවූ ඒවා බව ශිෂ්‍ය කණ්ඩායමක් පැවසීය. විරෝධතාකරුවන් වෙත කිහිප දිසාවකින් කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කරමින් විසිර යාමට ඉඩ අහුරමින් ශිෂ්‍යයන්ව වට කළ බව ඇසින් දුටු සාක්ෂි කරුවන් කියා සිටියහ. කඳුළු ගෑස් ප්‍රහාර වලින් අනතුරට පත් වූ ශිෂ්‍යයන් පසු බසින විට ඔවුන් වෙත තවත් කඳුළු ගෑස් ප්‍රහාර එල්ල වී ඇත. පොලීසිය විසින් ගස් අසල සැඟවී සිටින ශිෂයයන්ද ඇතුළු සියළුම දෙනා පසු පස හඹා යමින් මේ ප්‍රහාර එල්ල කර ඇත. විරෝධතාකරුවන් සාමකාමීව හැසිරී ඇති බව වීඩියෝ සහ සෙසු වාර්තා වලින් පෙනී ගියත් ශිෂ්‍යයන්ට පාර්ලිමේන්තුව දෙසට යාමට ඉඩ ලබා දීමෙන් ඒ වන විට සැසියක් පැවැත්වෙමින් තිබුණ පාර්ලිමේන්තුවේ ආරක්ෂාව ට තර්ජනයක් විය හැකි බව පොලීසිය ප්‍රකාශ කළේය.

ඉහල: ප්‍රහාරයෙන් තුවාල ලැබූ ශිෂ්‍යයකු (ඡායාරූපය: අන්තර්ජාලය )

http://www.amnesty.org/en/library/asset/ASA37/013/2014/en/77d973b8-c8e9-4b48-8fdd-117dae225789/asa370132014en.pdf (අවසන් පිවිසුම 2014 නොවැම්බර් 22)

## G. විපක්ෂ දේශපාලන පක්ෂ මර්දනය

### 26. විපක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ මාධ්‍යවේදීන් දෙදෙනෙකු ට ප්‍රහාර

කොම්පඤ්ඤ වීදියේ පිහිටි ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පුහුණු මධ්‍යස්ථානයේ තොරතුරු රැස් කිරීමේ චාරිකාවක නිරත වූ එක්සත් ජාතික පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පිරිසකට මැර පිරිසක් විසින් ප්‍රහාරයක් එල්ල කර ඇත. රවි කරුනානායක, ආර්. යෝගරාජන්, අජිත් පී. පෙරේරා සහ නලින් බණ්ඩාර ජයමහ යන මන්ත්‍රීවරුන් මෙම චාරිකාවේ නිරත වී ඇත. මේ පිරිස අදාල ස්ථානයෙන් පිටව යන අවස්ථාවේදී මන්ත්‍රී වරුන් දෙසෙට එල්ල කළ ගල් ප්‍රහාර වලින් මාධ්‍යවේදීන් දෙදෙනෙකුද තුවාල ලැබූ බව පෙරේරා මහතා ප්‍රකාශ කළේය. 2015 දී පැවැත්වීමට නියමිත ජනාධිපතිවරණයේ ප්‍රචාරක කටයුතු සඳහා රජයේ සේවකයන් සහ රජයේ සම්පත් යොදා ගන්නා ආකාරය ඔවුන් දුටු බව පෙරේරා මහතා තව දුරටත් ප්‍රකාශ කළේය.

http://www.dailymirror.lk/54673/journalists-among-unp-fact-finders-injured#sthash.9ZHt4zva.GqMaW99v.dpuf
(අවසන් පිවිසුම 2014 නොවැම්බර් 22)

### 27. උතුරු පළාත් සභා මන්ත්‍රීවරයෙකුගෙන් ප්‍රශ්න කිරීම



ඔක්තෝබර් 18 වන දින ශ්‍රී ලංකා යුධ හමුදාවේ සෙබළුන් කිහිප දෙනෙක් විසින් උතුරු පළාත් සභාවේ ක්‍රියාකාරී මංත්‍රීවරයකු වන බාලචන්ද්‍රන් කජදීපන් මහතාගෙන් ප්‍රශ්න කර ඇත. *"ඊලාලෛ පිහිටි මගේ නිවසට පැමිණි ආරක්ෂක හමුදා ඇඳුමින් සැරසුණු සෙබළුන් තිදෙනෙක් මගේ පවුලේ විස්තර අසා සිටියා. මගෙන් ප්‍රශ්ණ කිරීමට ඉහළින් නියෝග ලැබී ඇති බව ඔවුන් පැවසුවා. ඉන් එක් පුද්ගලයෙකු ඔහු වාස විලන් යුධ හමුදා කඳවුරේ ප්‍රධානියා ලෙස හඳුන්වා දුන්නා. "* යනුවෙන් දෙමළ ජාතික සන්ධානයේ කජිදීපන් මහතා මාධ්‍යයට ප්‍රකාශ කළ බව වාර්තා විය. ප්‍රශ්න කිරීමට පැමිණි සෙබළුන් තර්ජනාත්මක ස්වරූපයෙන් නොහැසිරුණු අතර මේ සිදුවීම ඔවුන් තමාව නිරීක්ෂනය කරන බවට කළ අනතුරු හැඟවීමක් බව ඔහු ප්‍රකාශ කර සිටියේය.

http://www.colombomirror.com/?p=502 (අවසන් පිවිසුම 2014 නොවැම්බර් 22)



ඉන්ෆෝම් - මානව හිමිකම් දත්ත කේන්ද්‍රය
www.ihrdc.wordpress.com / informcolombo@gmail.com